| ජාතික සම්පත | ධන නිධානය | මහජන සම්පත | ලග්න වාසනාව | සුපර් බෝල් | මෙගා පවර් | ගොවිසෙත |
|---|---|---|---|---|---|---|
| 1502 වැනි වාරය මාර්තු : 02 වැනිද ජයග්‍රාහී ලග්නය - තුලා | 1077 වැනි වාරය මාර්තු : 02 වැනිද ජයග්‍රාහී අක්ෂරය - X | 5047 වැනි වාරය මාර්තු: 02 වැනිද ඉංග්‍රීසි අකුර - A | 3734 වැනි වාරය මාර්තු:02 වැනිද ලග්නය - කටක | 2022 වැනි වාරය මාර්තු: 02 වැනිද ඉංග්‍රීසි අකුර - C | 1395 වැනි වාරය මාර්තු: 02 වැනිද සුපිරි අංකය: 26 ඉංග්‍රීසි අකුර - H | 3289 වැනි වාරය මාර්තු : 02 වැනිද ඉංග්‍රීසි අකුර - S |
| 7-8-1-7-7-4 | 28-35-36-53 | 6-5-2-8-4-3 | 06-23-33-50 | 05-12-17-28 | 16-38-41-60 | 07-57-64-78 |

| සසිරි | ජයෝදා | අද කෝටිපති | කප්රුක | සංවර්ධන වාසනාව | හඳහන | ශනිද වාසනාව |
|---|---|---|---|---|---|---|
| 294 වැනි වාරය පෙබ: 28 වැනිද | 1901 වැනි වාරය මාර්තු: 01 වැනිද ඉංග්‍රීසි අකුර - J | 1848 වැනි වාරය මාර්තු:02 වැනිද ඉංග්‍රීසි අකුර - F | 1198 වැනි වාරය මාර්තු: 02 වැනිද ඉංග්‍රීසි අකුර - I සුපිරි අංකය - 36 | 575 වැනි වාරය මාර්තු: 02 වැනිද දෛව අංකය - 07 ඉංග්‍රීසි අකුර - D | 356 වැනි වාරය මාර්තු: 02 වැනිද ලග්නය: කන්‍යා | 4183 වැනි වාරය මාර්තු: 02 වැනිද ඉංග්‍රීසි අකුර - A |
| 17-32-33 | 12-21-24-47 | 11-18-72-74 | 22-29-32-56 | 10-33-36 | 03-11-35-39 | 16-20-53-65 |

# හොර තරාදියෙන් ගම්මිරිස් කිරුවාට කතගෙන් කොසු පහර

දේදියේ සක්කි

**පවතින මිලටත් වඩා වැඩි මිලකට ගම්මිරිස් ගන්නවා කියා යතුරු පැදියෙන් ගමට පැමිණි වෙළෙන්දාට අලෙවි කළ කිලෝ දහයක ගම්මිරිස් ගෝනිය හිටි ගමන් කිලෝ හතක් බවට පත්වෙලා. හොර තරාදියක් අරන් බඩු ගන්න ගමට පැමිණි වෙළෙන්දාට ගැමි කත දෙන්නට ගිය කොසු ප්‍රහාරය හමුවේ ආපු පාරත් අමතකව ගිය පුවතක් පස්දුන් කෝරළයේ ගම්මානයකින් වාර්තාවේ.**

මේ දිනවල ගම්මිරිස් සඳහා තරමක ඉහළ මිලක් පවතින නිසා ගැමි කාන්තාවක් තම ඉඩමේ තිබූ ගම්මිරිස් අස්වැන්න නෙළා වේළා ගෙදර තිබූ තේ දළු කිරන තරාදියෙන් කිරා, කිලෝ 10කටත් වඩා වැඩි ප්‍රමාණයකින් යුත් ගෝනියක් වෙළෙඳපොළට ගෙන යන බලාපොරොත්තුවෙන් වෙන් කොට තිබිණි.

දිනක් යතුරුපැදියකින් පැමිණි වෙළෙන්දකු ගම්මිරිස් තිබේ නම් වෙළෙඳ පොළේ මිල වෙන්නේ කිලෝවක් රුපියල් 1800ක් බවත් තමා කිලෝවට රුපියල් 2000, ගණනේ ගෙවන බවට පවසා ඇත.

වෙළෙන්ද කියූ පරිදි වෙළෙඳ පොළ මිල නිවැරදි නිසා කාන්තාව තම නිවසේ තිබූ ගම්මිරිස් ගෝනිය වෙළෙන්දට ලබා දී තිබේ. වෙළෙන්ද ගෝනිය ඔහුගේ තරාදියෙන් කිරා බලා කාන්තාවට රුපියල් 14000ක් ලබාදී ඇති අතර කාන්තාව ඇයි මේ මුදල් අඩුවෙන් කියා වෙළෙන්දගෙන් විමසූ විට ඔහු පවසා ඇත්තේ 'ඇයි නෝනා කිලෝ හතයිනෙ' තිබ්බේ කියාය.

එවිට කාන්තාව මොනවා, ඔතන කිලෝ හතක් නෙවෙයි කිලෝ දහයකටත් වඩා වැඩියෙන් තිබෙනවා. අපි හැමදම අපේ තේ දළු කිරන තරාදියෙන් කිරුවේ ඒක හරියටම හරි. මේකයි එහෙනම් වෙළෙඳ පොළේ මිලටත් වඩා වැඩියෙන් මිලට ගම්මිරිස් ගන්නවා කියා මාව රවටන්න හැදුවේ. හොඳ හිතින් හොර තරාදියත් අරන් බහිනවා දෙට්ට කියමින් එම කාන්තාව වෙළෙන්ඳට කොසු පහරක් එල්ල කළාය.

■ බුලත්සිංහල ලක්මි කුඩලිගම

# මිනුවන්ගොඩ උසාවියේ කුණු ගොඩකින් පිස්තෝලයක් හමුවේ

■ ගම්පහ අධිකරණ-ටෝනි කරුණානායක සහ ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය

**මිනුවන්ගොඩ දිසා සහ මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණ භූමියේ ඇති කුණු ගොඩක සඟවා තිබූ මෙරට නිෂ්පාදනය කරන ලද කුඩා පිස්තෝලයක් අවියක් ඊයේ (02) සොයාගත් බව මිනුවන්ගොඩ පොලිසිය පවසයි.**

අධිකරණ නියමයෙන් අධිකරණ භූමියේ ප්‍රජා සේවයේ යෙදී සිටි

අයකුහට අධිකරණ භූමියේ පවිත්‍රතා කටයුතු සිදු කරමින් සිටියදී මෙම පිස්තෝලය හමුවී ඇති බව පොලිසිය පවසයි. පොලිතින් උරයක් තුළ බහා තිබූ මෙම පිස්තෝලය දිරාපත් වෙමින් පවතින එකක් බව පොලිසිය කීය.

මිනුවන්ගොඩ දිසා සහ මහේස්ත්‍රාත් අධිකරණයේ ප්‍රධාන ලිපිකරු සිදු කළ පැමිණිල්ල මත පොලිසිය භාරයට ගත් මෙරට නිෂ්පාදනය කරන ලද එම කුඩා පිස්තෝල වර්ගයේ ගිනි අවිය අධිකරණ නියෝග ලබාගෙන වැඩිදුර විමර්ශන සඳහා රජයේ රස පරීක්ෂක වෙත යොමු කිරීමට කටයුතු කරන බව මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුරටත් සඳහන් කළේය.

## තිස්ස හේවාවිස්සගේ හිනා වැස්ස










